# Living the Lotus

*Buddhism in Everyday Life*




***Founder's Reflections***

## ස්තූතියි යන වචනය

'ඔව්' යැයි, ප්‍රතිපිලිතුරු ලබා දීම, 'බොහොම ස්තූතියි' යන වචනය, ඕනෑම වෙලාවක, ඕනෑම තැනකදී, මුවගට නැගිය හැකිනම්, බැතිමතෙකු ලෙස ඔබ ලබාගන්නා ජයග්‍රහනයක් යැයි මම සිතනවා.

සෑම විටම මුහුණේ සිනහව අමතක නොකර, 'ඔව්' යැය, ඔබ උස් හඬින් ප්‍රති පිලිතුරු දෙනවිට, හදවත සම්පූර්ණයෙන්ම වෙනස් කරගත හැක. එවන් හදවතක් පවත්වාගන යනවා නම්, නෞකාවක සුක්කානම මෙන් ක්‍රියා කරමින්, සතුට ඇති දිශාවට මිනිසුන්ව රැගෙන යා හැකිය.

සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය, මේ ලෝකයේ සිදුවන එක් එක් දේවල්, ඇයි මේ දේවල් සිදුවන්නේ, එහි මූලික සිද්ධාන්තය කියාදෙමින්, එම මූලික දෘෂ්ඨිය මත පදනම්ව, මිනිසුන් සමග සහසම්බන්ධ වෙමින්, එසේම මුෂායෙකු ලෙස ජීවත් විය යුතු ආකරය අපට කියාදෙයි.

'මෙවන් විශිෂ්ඨ මාර්ගයක් අපට කියාදී, සෑම දිනකම සතුටින්, කෘතවේදී' යන හදවතට පත් වන්නේනම්, එය අපගේ හදවතේ වර්ධනය යැයි කීම වරදක් නැතැයි මම සිතමි.

'සතුට යනු 'ස්තූතියි' යැයි පැවසීම' යැයි කියූ පුද්ගලයකු සිටියා. කෘතවේදී හදවත, අපට ජීවිතයේ තිබෙන්නා වූ වටිනාම සම්පතයි.

නිර්මාතෘ සංකල්පනා ග්‍රන්ථය ඇසුරිනි. 10, P. 194-195

රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය 1938 වර්ෂයේදි නික්යෝ නිවානෝ තුමා හා මියාකෝ නගනුමා මහත්මිය විසින් ස්ථාපිත කරන ලදී. සද්ධර්ම පුණ්ඩරීක සුත්‍රය මුලික කරගෙන එහි කටයුතු කරනු ලැබේ. පවුල තුලත්, කාර්යාලයේදීත්, සමාජයේදීත් බුදු දහම ජිවිතයට බද්ධ කර ගෙන, සාමාකාමි ලෝවක් බිහි කිරීමට ප්‍රාර්ථනා කර කටයුතු කරන එකමුතුවකි.

වර්තමානයේදී නිචිකෝ නිවානෝ ප්‍ර ධානීතුමාගේ මුලිකත්වයෙන්, සාමාජික සාමාජිකාවන් සෑම ධර්ම ව්‍යප්තියේ යෙදෙමින් අත් වැල් බැදගෙන සෑම රටකම සාම ක්‍රියාකාරකම් වල නියැලි සිටියි.


**Living the Lotus**
**Vol. 200 (May 2022)**

Senior Editor: Keiichi Akagawa
Editor: Jigjidkhorloo Gereltuya
Copy Editors: Ruklanthi Palipana, Sahan Chamara , Rajitha Madurangha

*Living the Lotus* is published monthly by Rissho Kosei-kai International,


Fumon Media Center, 2-7-1 Wada, Suginami-ku, Tokyo 166-8537, Japan.
TEL: +81-3-5341-1124
FAX: +81-3-5341-1224
Email: living.the.lotus.rk-international@kosei-kai.or.jp


Living the Lotus-Buddhism in Everyday Life (සද්ධර්ම පුණ්ඩරීක සුත්‍රය තුල ජීවත්වෙමු - එදිනෙද දිවියට බුදු දහම බද්ධ කර ගනිමු.) යන තේමාව තුල, එදිනෙද ජිවිතයට සද්ධර්ම පුණ්ඩරීක සුත්‍රයේ කියාදීම් බද්ධ කර ගෙන මඩෙහි පිපෙන්නාවු ලස්සන නෙලුම් මලක් සේ තම ජිවිතය සමෘධිමත් කරගෙන, එලෙසම වැඩි වටිනාකමින් යුතු තත්වයට පත් විය යුතුය යන ප්‍රාර්ථනය ගැබ් වී ඇත. මෙම සඟරාව මගින් ලෝකය පුරා ව්‍යාප්ත වී සිටින්නාවු සාමාජික සාමාජිකාවන් එදිනෙද දිවියට බුදුදහම බද්ධ කරගෙන කටයුතු කරන්නාවු අයුරු අන්තර්ජාල මාර්ගයෙන් බෙදහැරීම සිදු කරනු ලැබේ.

# දරා ගැනීමට නොහැකිවීම  ක්ෂාන්තිය - ①

නිචිකෝ නිවානෝ තුමා
ප්‍රධානී, රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය



## විද දරා ගැනීමේ ශක්තිය

අපි දුෂ්කර කාල පරිච්ඡෙදයකදී හෝ අපි අකමැති දෙයක් ඇති විටකදී අප එය අත්හැර අහක බලමින් හෝ එම දෙයින් පලා යාමට උත්සාහා ගත්තද, ඒ තුලින් අපට මුණ ගැසෙන පුද්ගලයන් හෝ අපහසුතාවයන් මඟහරවා ගත නොහැක.

වසර තිස් එකකට පෙර, සංගමයේ සභාපති ධූරයට පත්වීමෙන් පසු වසරේ සිට මා අවුරුදු 10 ක්ම ගත කරනු ලැබුවේ අප සංගමයේ සාමාජිකයින් සමඟ විශ්වාසනිත්වය වැඩිදියුණු කරගැනීම උදෙසා “සාමාජිකයන්ව හමුවීමට යාමනි”. සමහර අවස්ථා වලදී, සුවිශාල රැස්වීම් ශාලාවක විශාල වේදිකාවක් මත තනිවූ මම, දස දහස් ගනනකට වඩා ඉක්ම වූ අසන්නන් පිරිසක් ඉදිරියේ කථා කිරීමේ අවස්ථාද තිබින. පිරිසක් ඉදිරියේ ප්‍රසිද්ධව කථා කිරීමේ සුවිශේෂත්වයක් නොමැති මා එයට “අදක්ෂය” යනුවෙන් හා එයින් පලායාමට සිත් වූ අවස්ථාවන් එකකට වඩා තිබූ බවනම් සහතිකය.

ඒ කෙසේ වෙතත්, වයස් ගත වීමත් සමඟ ආ පසු හැරී බලන විට, “අදක්ෂය” යන ඒ අවස්ථාවේදී ඇති වූ හැඟීම සහිත අත්දැකීමම අද මාගේ වර්ථමානය සාක්ෂාත් කරගැනීමට හේතු වූ බවනම් සහතිකය. අදක්ෂතාවය දක්ෂතාවයකට බොහෝ විට පත් නොවන අතර, තරුණ කාලයේ ඉවසීම මෙන්ම විඳදරා ගැනීම කෙලවරක් නොමැති යැයි සිතුවත්, වයස් ගත වීමත් සමඟම අපි සිතන පතන ආකාරය වෙනස්වන බව අත්දැකීමට හැකිවුනා.

අපි සිතන පතන ආකාරය වෙනස් කල විට ,අපේ හදවත තුල තිබෙන තරහව, අමතක කල නොහැකිලෙස සිතේ පැලපදියම්ව තිබෙන දුක් පීඩාවන්ද, උපේක්ෂා සහගතව දරාගෙන, ජීවත්වීම සදහා විශාල බලයක් ගොඩනැගෙන බවයි. “ක්ෂණික කෝපවන්නෙක් දැඩි වීර්ය සිත් ඇත්තෙක් කරන්නේය” යැයි විවිධාර්ථ සූත්‍රයෙහි සඳහන් කර ඇත. දැඩි කෝපය මෙන්ම වෛරය සිතට නැගෙන විට, එය විඳදරා ගතහැකි ඉවසීමේ සිතක් ඇතිවේ. එසේ වන්නේ බුද්ධ දේශණාව ඉගෙන පිළිපදින පුද්ගලයන්ගේ පින් බලය නිසාය. මෙහිදී මා වැදගත් යැයි අදහස් කරනු ලබන්නේ “සිත අවධි කිරීම” යන වචනයයි. අපහසුවෙන් වුවද, “කෝපය මැඩ පවත් වන්න” “ඉවසා දරා ගන්න” යනුවෙන් නොව තමා තුල තිබෙන බුද්ධ ස්වාභාවය තුලින්ම, ස්වාභාවිකව විඳදරා ගැනිමේ ශක්තිය “සිත අවධි කරවීම” කල විට දුකින් මිදීමට හැකිවේ යැයි මම සිතනවා. ක්ෂාන්තිය යනු හුදු ඉවසීම පමණක් යැයි කියාදෙන ඉගැන්වීමක් නොවේ.

ක්ලේශයන් යනු විටෙක බෝධිසත්ව යනුවෙන්ද ප්‍රකාශ කල හැකි නමුත්, යමෙකුට නින්දා කරන වෛර කිරීම දක්වා වර්ධනය වූ සිතක්, අනික් අතට කෙනෙකුගේ අභයන්තරයේ තිබෙන්නාවූ බුද්ධ ස්වාභාවය අවධි කිරීමටද ඉවහල්වේ. එම අවස්ථාවේදී කුමන ආකාරයේ දුක් වේදනාවක් වුවද ධනාත්මකව බාරගෙන ඒවාට මුහුණ දීමට හැකි ක්ෂාන්තියක් ඇති වන්නේ නම්, බුදුන් වහන්සේගෙන් ලබා ගන්නාවූ විවරණය පිළිබඳ භක්තියෙන් යුතුව ස්තුතිවන්තවිය හැක.

## (ඉවසීම) යනු (පිළිගැනීම) කරා යාමකි

එක්තරා පුද්ගලයකුගේ වාක්‍ය සටහනකට අනුව, ක්ෂාන්තිය යනු “ග්‍රහණය කර ගැනීම හා එය පිළිගැනීම මත පදනම්ව පවතින බවය”, සත්‍ය වශයෙන් එය එසේමය. මිනිසුන් කෙරෙහි කෝපය සහ වෛරය, දුර්වලකම් සහ පිළිකුල් සහගත දේ ජය ගැනීම, පරිසරය හා තත්වයන් ග්‍රහණය කරගැනීමේදීත්, පළමුවෙන්ම ඔබ ඉදිරියේ සිටින පුද්ගලයින් සහ සිදුවීම් ඒ ආකාරයටම පිළිගැනීම, ක්ෂාන්තිය ස්වභාවිකවම දෛනික ජීවිතයට පුරුදු පුහුණු කිරීම පිණිස හේතුවක් වනු ඇත.

“ස්වකීයත්වය සැහැල්ලුවට ලක් නොකරන්න” “සියල්ලෝම බුද්ධ ප්‍රාප්තියට පත් විය යුතුය” යනුවෙන් දොහොත් මුදුන් දී අගර්හිත බෝධිසත්වයන්ට වන්දනා කරන ජනී ජනයා නින්දා අපහාස ලබන විට, අගර්හිත බෝධිසතුන් වහන්සේ “ඒවා පිළිගනිත්වා” යැයි සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයෙන් පහදා වදාල සේක. මෙම ඉවසා දරා ගැනීමේ පදනම යනු, අන් පුද්ගලයන් තුල තිබෙන්නාවූ බුද්ධ ස්වාභාවයට නමස්කාර කිරීම, පෞද්ගලිකත්වය පිළිගැනීමට හදවතේ ඇති කැමැත්ත සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය මගින් පෙන්වා දෙන ඉතාමත් වැදගත් කරුණක් යැයි මම සිතනවා.

ග්‍රහණය කර ගැනීම හා එය පිළිගැනීම. මෙය තම සිත සැහැල්ලු කරගැනීමට හේතුවක් වනු ඇත. ඉවසා දරා ගෙන සිටීම ඉතාමත් අපහසු දෙයක් වුවද, එම ස්වාභාවය ඒආකාරයෙන් පිළිගන්නේනම්, සිත්හි ඇතිවන අඩුලුහුඩු කම්, අසම්තෘප්තිය, ක්‍රෝධය, වෛරය යන චෛතසික හැඟීම් සංසිඳෙන අතර සිත් පීඩාකාරී හා වේදනාත්මක හැඟීම් සමනය කිරීමට හේතුවක් වනු ඇත. එසේම ෂෝතකු කුමාරයා (17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා තුල) “ඔබ හා වෙනත් අයකුත් අතර තිබෙන්නාවූ වෙනස නිසා කෝපයට පත්වීම නුසුදුසුය. මා සහ ඔහුත් යන දෙදෙනාම සාමාන්‍ය පෘතජ්ජන පුද්ගලයෝ වම්හ, දෙපාර්ශයම ප්‍රඥාවන්ත මෙන්ම අඥානයෝ ද වම්හ” යැයි සඳහන්කර තිබේ. දෙපාර්ශයම ප්‍රඥාව මෙන්ම අඥාන යන ද්වි ලක්ෂණ වලින් සමන්විත වන්නේයි පිළිගැනීම තුලින්, තම තමන් තුල රෝපණය වී ඇති ක්‍රෝධය යටපත් කිරීමට හැකියාව ලැබෙනු ඇත.

කෙසේ වෙතත්, මෙය ක්ෂණිකව ක්‍රියාවට නැගීමට හැකි අවස්ථා මෙන්ම, මීට පෙර ඉහතින් පෙන්වා දුන් පරිදි, කාලයාගේ ඇවෑමෙන් සහ පසුකාලීන අත්දැකීම් හරහා, ක්ෂාන්තිය තුලින් ලැබෙන්නාවූ ආනිශංස භුක්ති විඳීමට හැකියාව ලැබෙනු ඇත. ඒ අනුව, ක්ෂාන්තිය බෝධිසත්ව චර්යාවේ කොටසක් වනවා සේම, ක්ෂාන්තිය තුල දයාවේ කාර්යක් ලෙස පරාර්ථකාමී ගුණාංගයන් ගැබ් වී ඇති බව අමතක නොකල යුතු යැයි මම සිතනවා.

From *Kosei*, May 2022.

Spiritual Journey

# ගකුරින් ජීවිතයෙන් ඉගෙන ගත් දේ

ඔෂාධි ලක්ෂිකා ලියනගේ
ශ්‍රී ලංකා ධර්ම ශාඛාව

මෙම සෙප්පෝව 2022 වර්ෂයේ පෙබරවාරි මස 21වන දින ගකුරින් පාසලේදී විදේශීය පුහුණු සිසුනගේ උපාධි උත්සවයේදී ඉදිරිපත් කරන ලද්දකි.

මම, 2012 වර්ෂයේදී ශ්‍රී ලංකා ධර්ම ශාඛාවේදී පැවැත්වූ තරුණ සම්මන්ත්‍රණයට සහභාගී වීමත් සමඟ රිෂ්ෂෝ කෝසෙයි කායි එකට ඇතුළත් වුනා. ශ්‍රී ලංකා ධර්ම ශාඛාවේ සාමාජික සාමාජිකාවන් හදවතින්ම බුද්ධ වන්දනාව කරන ආකාරය වගේම පුද්ගලයන් සමඟ උණුසුම් හදවතක් ඇතිව කටයුතු කරන ආකාරය වෙනත් ආගම් වලට වඩා වෙනස් කියලා දැණුනා. තවද, නිර්මාතෘ තුමාගේ 'අධිෂ්ඨාන 06' අසා පුදුමයට පත් වුණා ඒක අදටත් හොඳින් මතකයි. විශේෂයෙන්ම 3 වන අධිෂ්ඨානය වන 'අන් අය කරන්න අකමැති දේ තමන්ගේ වැඩක් ලෙස බාරගෙන කරගෙන යාම' ඒ වගේම, 5 වන අධිෂ්ඨානය වන 'ැකියාව කරන විට කිසිවෙකු හෝ බලාගෙන සිටියත් නැතත් තමන් තමන්ට අවංක වී වැඩ කටයුතු කිරීම' කියන නිර්මාතෘ තුමාගේ අධිෂ්ඨානයන් අසා මමත් නිර්මාතෘ තුමා වගේ පුද්ගලයෙක් වෙන්න ඕන කියලා හිතුවා.

රිෂ්ෂෝ කෝසෙයි කායි එකට සම්බන්ධ වී විවිධ කටයුතු වලට සම්බන්ධ වන විට ගකුරින් පාසලේ අධ්‍යාපනය ලැබූ ජ්‍යේෂ්ඨ නායකයින් මුණගැසුණා. ඒ අයගෙන් ප්‍රයෝගික බුදු දහම ඉගෙන ගත්තේ කෙසේද කියා ඇහුවාම ගකුරින් පාසල ගැන දැනගන්න ලැබුණා. ගකුරින් පාසලට ඇතුළත් වීම නම් අමාරුයි කියා හිතුණා. නමුත් තායිලන්තයේදී පැවැත්වූ ජාත්‍යන්තර තරුණ නායකත්ව පුහුණු සම්මන්ත්‍රණ වලට සම්බන්ධ වීමත් සමඟ ප්‍රයෝගික බුදුදහම ගැන තවදුරටත් ඉගෙන ගන්නට ආශාවක් ඇති වී 'ප්‍රයෝගික බුදුදහම හොඳින් ඉගෙන ගෙන සෑම කෙනෙකුටම කියා දෙනවා.' කියන හැඟීම ඇතිවුණා. ඉන් පසු කලින් සේවය කල යමමොතො කියෝකයිචෝ සාන් ගෙන් ගකුරින් පාසලේ ඉගෙන ගැනීමට අවස්ථාවක් ලැබුණු නමුත්, ඇතුලත්වීමේ විභාගය සමත් වීමට නොහැකි වීම කණගාටුදායක කරුණක් වුවත් එතැනින් නතර නොවී කෝසෙයි කායි එක සමඟ දිගටම සම්බන්ධ වී කටයුතු කරගෙන ගියා. අවුරුද්දකින් පසුව වර්තමාන කියෝකයිචෝ සාන් වන සුසුකි හිරොනොබු මහතාගේ අනුමැතියෙන් නැවතත් ගකුරින් පාසලේ විභාගයට මුහුණදී ගකුරින් පාසලට ඇතුළත් වීමට හැකි වුණා.

කොරෝනා වසංගතයේ ආරම්භයත් සමඟ ජපානයට යාමට පිටත් වූ අවස්ථාවේ ජපානයට යන ගුවන් යානය ඇත්තටම පිටත් වේවිද යන දෙගෙඩියාවෙන් ගුවන් තොටුපල වෙත ගිය නමුත් මගේ පවුලේ සියලු දෙනාගේත්, ශ්‍රී ලංකා ධර්ම ශාඛාවේ සාමාජික සාමාජිකාවන්ගේ පිහිටෙන් කරදරයක් නොමැතිව ජපානය බලා යාමට හැකියාව ලැබුණා. ඒ වගේම බුදුන් වහන්සේගේ පිහිටත් ලැබුණා කියා දැණුනා. ගුවන් යානයට ගොඩවූ පසු විවිධ දේවල් කල්පනා කිරීමත් සමඟ කඳුළු එක දෙක වැටෙන්නට වුනා. ඒ මොහොතේදී නිර්මාතෘ තුමා තමන්ගේ ගමේ ඉඳන් තෝකියෝ වලට යන විට අධිෂ්ඨාන කරගත්තාක් මෙන් මමත් 'මොන දේ සිදු වුවත් එය ජය ගෙන ඉදිරියට යනවා' කියන දැඩි සිතුවිල්ල හිතේ තියාගෙන ජපානය වෙත ගියා.

මම ගකුරින් පාසල් ජීවිතයේදී ඉගෙනගත් දේවල් කරුණු 3 කින් ඉදිරිපත් කරන්න කැමති. පළමු කරුණ නම්, එකම කණ්ඩායමේ අයගෙන් ඉගෙන ගත් දේවල්.

කරදරයක් නොමැතිව ජපානයට පැමිණීමට හැකිවීම ගැන ගොඩක් ස්තූතිවන්ත වන නමුත්, කොරෝනා වසංගතය නිසා ජපන් භාෂා පාසලේ ඉගෙනීම් කටයුතු සියල්ල ඔන්ලයින් හරහා සිදු කල නිසා දවසේ වැඩිහරියක් එකම කණ්ඩායමේ අය සමඟ කාලය ගත කරන්නට වුනා.

එකම කණ්ඩායමේ සිටි දෙදෙනා සමඟ කටයුතු කරන විට බොහෝ නොගැලපීම් සිදුවුනා. නොනවත්වා කරන කතා වලින් වෙහෙසට පත් වුණා වගේම විටෙක කාතා දිග්ගැසීමත්



ගකුරින් පාසලේ තම උපාධි උත්සවයේදී සෙප්පෝව ඉදිරිපත් කරන ලියනගේ සාන්

සමඟ නොගැලපීම් මතු වුණා. ඒත් සමග මෙම නොගැලපීම් සමග හොඳ සම්බන්ධතාවයක් පවත්වා ගන්නේ කෙසේද යන්න සිතන්නට පටන් ගත්තා.

එලෙස කනස්සල්ලෙන් සිටින විට, ගකුරින් පාසලේ හිටපු විදුහල්පති වතනබේ මහතාගේ දේශනයකට සහභාගී වුනා. එම දේශනයේදී මම කනස්සල්ලට පත්ව සිටි කාරණය ගැන පැවසූ විට, 'සූත්‍ර සජ්ජායනයෙන් පසු විනාඩි 2 ක් 3 ක් තමන් ගැන පසු විපරම් කරන්නට වෙලාව වෙන් කරගන්න.' කියා උපදෙස් ලබා දුන්නා.

ඉන්පසු හැමදාම සවස සූත්‍ර සජ්ජායනයෙන් පසුව මගේ හදවත චලනය වුණේ කොයි ආකාරයට දැයි කියා පසු විපරම් කර බැලුවා. එවිට එකම කණ්ඩායමේ අය සමඟ එකට ඉන්න විට සතුටට පත් වෙමින්, දුකට පත් වෙමින්, තනිකමට පත් වෙමින්, සහයෝගයෙන් වැඩ කරන්න ඕන කියලා සිතන සිතුවිලි වගේම පුද්ගල සම්බන්ධතාවයේදී විටෙක බියට පත්වෙමින්, විටෙක කෝපයට පත්වෙමින් තියෙන මගේ වෙනස් වන හදවතේ සිතුවිලි ටිකෙන් ටික පෙනෙන්නට පටන් ගත්තා. ඉන් පසු ස්තූතිවන්ත හැඟීමකට පත් වී කණ්ඩායමේ අයගේ හොඳ පැත්ත පෙනෙන්නට පටන් ගත්තා.

එකම කණ්ඩායමේ සිටි රොනී මහතා මගේ දේවල් ගැන සොයා බලන නිසා සෑම විටම හිතේ තියෙන දේවල් කෙලින්ම ඉදිරිපත් කලා. රොනී මහතාගේ මෙම ක්‍රියාවන් නිසා ඔහුගෙන් ඈත්ව සිටීම හොඳයි කියා සිතුනා. ඒ වගේම කතා කරන්න වත් හිතුනේ නැහැ. නමුත්, ඈත්ව සිටීමෙන් අනිත් පුද්ගලයා සමඟ තියෙන සම්බන්ධය දුරස්ව පවතිනව වගේම, කියන්න අවශ්‍ය දේවල් වචන වලින් පිට කර පැවසීමත් ඉතාම වැදගත් බව වටහා ගත්තා.

අමරා මහතා ගැන කිවහොත්, මම සහ රොනී මහතා සමඟ ඇතිවන වාද විවාද වලදී අප අතරට පැමිණ අප දෙදෙනාව සමතයකට පත්කරන්නට සෑම විටම උදව් කලා. අමරා මහතාගේ හොඳ ගතිගුණ නිසා බොහෝ වාරයක් උපකාරී වුණු අවස්ථා තිබුණා.

වර්තමාන කොරෝනා වසංගතය සමඟ ගෙවූ ගකුරින් ජීවිතය බොහොම අපහසු වුන නමුත් එම පිහිටෙන් මට ඇත්තටම හොඳ පිරිසක් සමඟ කටයුතු කරන්න ලැබුණා කියලා හිතනවා.

රොනී මහතා අමරා මහතා බොහොම ස්තූතියි.

දෙවෙනි කරුණ නම්, ගකුරින් පාසලේදී පැවැත් වුණු ප්‍රායෝගික පුහුණු පාඨමාලාවේදී ගකුරින් පාසලේ කාර්යමණ්ඩලයේ සේවය කරන තනකා මහත්මිය සමඟ කටයුතු කරන්නට අවස්ථාවක් ලැබුණා. එම පාඨමාලාව අතරතුරදී ඇය මට 'කවුරුත් නොබලන තැන් පිරිසිදු කිරීමේ වැදගත්කම' ගැන ඇය කියා දුන්නා.

පාඨමාලා කාලය අවසන් වී නේවාසිකාගාරයට පැමිණි මම නේවාසිකාගාරයේ කුස්සියේ සින්ක් එක සෑම දිනකම රාත්‍රී නින්දට පෙර පිරිසිදු කරන්නට පටන් ගත්තා. නමුත් ඉක්මනින් අපිරිසිදු වීම නිසා පිරිසිදු කිරීම නවත්තන්නට තීරණය කලා. ඒ වගේම සින්ක් එක භාවිතා කල පසු පිරිසිදු කරන්නැති නේවාසිකාගාරයේ ශිෂ්‍යයින් සමඟ තරහා සිතුවිල්ලක් ඇති වුණා.

ඉන්පසු දෙවනි පුහුණු පාඨමාලාවේදී නැවතවරක් පුද්ගල සම්බන්ධතාවයන්ගේ වැදගත්කම (හේතුපල දහම) ගැන ඉගෙන ගැනීමෙන් පසු අන් පුද්ගලයා වෙනස් කිරීමට නොව 'මොනදේ සිදුවුවත් තමන් එය ප්‍රායෝගිකව පුරුදු පුහුණු කරනවා' කියා තමන්ගේ සිතුවිලි වෙනස් කරගෙන ඉදිරියට යන එක වැදගත් කියා ඉගෙන ගත්තා. ඒවගේම අප අවට ඇති සෑම තැනක්ම පිරිසිදු කිරීම තුලින් හැමදේකටම වැඩිය තමන්ගේ හදවත පිරිසිදු හදවතක්, පොහොසත් හදවතක් බවට පත්වෙනවා කියා දැනුනා.

නිවිකෝ නිවානෝ තුමා අපට කියාදුන් 'තමන් මෙ මොහොතේ සිටින තැන ධර්මය පුහුණු කිරීමට හොඳම ස්ථානයයි' යන්න ගැන අවබෝධ කර ගත් නිසා නැවත ලංකාවට ගියද සිටින ස්ථානයේ සිට ධර්මය ප්‍රයෝගිකව පුහුණු කිරීමට අධිෂ්ඨාන කරගන්නවා.

තුන්වෙනි කරුණ නම්, මට උදව් කල සියලු දෙනාගෙන් ඉගෙන ගත් කරුණාව.

කලබලකාරී හැඟීමකින් ගකුරින් එකට ඇතුළත් වුවත් ගකුරින් එකේ සියලු දෙනා පළමු වරට දැකපු මම උණුසුම්ව පිළිගත් අයුරු, ඒවගේම මම ලෙඩ වූ සෑම අවස්ථාවකම මාව හොඳින් බලාගත්ත අවස්ථා, කාර්ය බහුල ජීවිතයක් ගත කරන ගකුරින් ශිෂ්‍යාවන් (ජපන් ජාතික ශිෂ්‍යාවන්) ජපන් භාෂාව වගේම සූත්‍ර සජ්ජායනයද එකට එක්ව පුහුණුවීම් වල යෙදුන අවස්ථා, තුවාල වී ගෙදර සිටි අවස්ථාවේ ගකුරින් පාසලේ නියෝජ්‍ය අධ්‍යක්ෂක වූ යොෂිළු ඕතොමෝ මහත්මිය මවක මෙන් කරුණාවෙන් සැලකූ අවස්ථාව, ෆුකුද මහත්මිය ඇතුළු, ජපන් භාෂා පාසලේ ගුරුවරුන් ආචාරශීලීව ජපන් භාෂාව ඉගැන්වූ අයුරු, ඒ වගේම  ගකුරින් එකේ ආචාර්ය වරුන් හැම මොහොතකම අපේ දේවල් වලට හොඳින් ඇහුම්දී අපව හොඳින් බලාගත්ත අවස්ථා, වගේ විවිද අවස්ථා වලදී කරුණාව දැක්වූ දේවල් වලින් මගේ තාත්තා හා මා අතර දුරස්ව තිබූ සම්බන්ධය ටිකෙන් ටික වෙනස් වෙන්නට පටන් ගත්තා.

කුඩා කාලයේදී තාත්තාට බය වී හැදුණු මම මගේ අවංක හැඟීම ප්‍රකාශකිරීමට නොහැකිව සිටියා. නමුත්, ගකුරින් පාසල් ජීවිතයෙන් ලබා ගත් අත්දැකීම් වල

පිහිටෙන් බයක් නොමැතිව තාත්තාගේ හදවතේ තියෙන සිතුවිලි වලට ඇහුම්කන් දෙන්න අවශ්‍යයි කියලා හිතුණා. ඒවගේම හැමෝගෙන්ම ඉගෙන ගත් කරුණාව මමත් හොඳින් පුරුදු පුහුණු වී පවුලේ සිටින එක් එක් අයගේ හදවත ඇතුලේ තිබෙන බුද්ධ ස්භාවය දැකීමට උත්සාහ කරනවා කියලා සිතුවා.

ගිය අවුරුද්දේ දෙසැම්බර් මස ගකුරින් පාසලේ නව විදුහල්පති වන සුගිනො මහතා සමඟ උපාධියෙන් පසු කුමක් කරන්නේද යන්න පිළිබඳ සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වුවා. එහිදී නැවත ශ්‍රී ලංකාවට ගියත්, විවාහ වුනත්, නොනවත්වාම ඉගෙන ගැනීමේ වැදගත්කම ගැන පැහැදීමත් සමග නව ඉලක්ක දෙකක් ගැන සිතුවා.

එකක් නම්, ජපන් භාෂාවෙන් නොනැවතී නව භාෂාවන් ඉගෙන ගැනීම. හින්දු, ක්‍රිස්තියානි වගේම විවිධ ආගම් වල අයට රිෂ්ෂෝ කෝසෙයිකායි එකේ ඉගැන්වීම් කියාදෙන්න අවශ්‍යයයි කියා සිතුන නිසා දෙමළ භාෂාව ඉගෙන ගන්න පටන් ගන්නවා කියා සිතුවා.

ශ්‍රී ලාංකිකයින් බොහෝ පිරිසක් තම හදවත තුල බුද්ධ ශක්තියක් තිබෙනවා යන්න ගැන අවබෝධ කරගෙන නොමැති බැවින්, ‘සෑම හදවතක් තුලම බුද්ධ ශක්තියක් ගැබ්ව තිබෙනවා යන්න’ පහදා දෙන්න අවශ්‍යයි කියා සිතුනා. එනිසා  මාගේ ප්‍රායෝගික පුහුණුවීම් තුලින් සෑම කෙනෙකු තුලම බුදුන් වහන්සේට සමාන වූ හදවතක් තියනවා යන්න පහදා දෙන්න අධිෂ්ඨාන කරනවා.

මෙම ඉලක්කයන් අමතක නොකර නැවත ලංකාවට ගොස් සිනහමුසු මුහුණින් කැපවීමෙන් කටයුතු කරන්න බලාපොරොත්තුවෙමි.

හැමෝටම බොහොම ස්තූතියි.



ගකුරින් පාසලේදී පැවැත්වූ ප්‍රායෝගික පුහුණු පාඨමාලාව
අතර තුර තම මිතුරන් සමග

# රිෂ්ෂෝ කෝසෙයි කායි හැඳින්වීම

## නික්යෝ නිවානෝ තුමාගේ ජීවිත කතාව සහ රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයේ ඉතිහාසය.

## නිචිකෝ නිවානෝ තුමාගේ ඉගැන්වීම්

නිචිකෝ නිවානෝ තුමා කොතැනකදී වුවත්, කොයි කාට වුවත්, නිතරම 'ප්‍රයෝගික පුහුණු කිරීම් 03 ක්' පිළිබඳව කියා දෙනවා.

1. නොවරදවාම උදෑසන සුභ උදෑසනක් ලෙසින් සුභ පැතීම.
2. කවුරුන් හෝ තමන්ට කතාකල විට 'ඔව්' ලෙසින් ප්‍රති පිළිතුරු දීම.
3. පාවහන් පිළිවෙලට තැබීම, භාවිතකල දෑ පිරිසිදු කර නැවත අදල ස්ථානයෙන්ම තැබීම.

අද සිටම නිවසේදීත්, පාසලේදීත් මෙන්ම කාර්යාලයේදීත් පුහුණු කරමු. අනිවාර්යයෙන්ම ප්‍රබෝධමත් බවක් දැනේවි කියා මා සිතනවා.




ඔබේ දැනුමට

මෙම 'ප්‍රයෝගික පුහුණු කිරීම් තුනට' පදනම වී ඇත්තේ, දර්ශනිකයකු මෙන්ම අධ්‍යානඥයකු වූ ෂින්සෝ මෝරි මහතා ඉදිරිපත් කල 'විනය පිළිබඳ මූලධර්ම තුන' වේ. මෝරි මහතා යුද සමයේදී අධ්‍යාපනය වෙනුවෙන් විශාල සේවයක් කල අයෙකි.




※කරුණාකර අවසරයකින් තොරව නැවත මුද්‍රණය කිරීමෙන් වළකින්න.

## මීලග සභාපති කෝෂෝ මහත්මිය





කෝෂෝ මහත්මිය, 1968 අවුරුද්දේ, නිච්කො නිවානෝ තුමාගේ වැඩිමහල් දියණිය ලෙස තෝකියෝ, සුගිනමි නගරයේදී උපත ලැබුවා. විශ්ව විද්‍යාල අධ්‍යාපනය අවසන් කර, රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයේ මානව සම්පත් කළමණාකරණය පිළිබඳව උගන්වනු ලබන පාසලක් වන ගකුරින් පාසලට ඇතුලත් වුනා. එහිදී බුද්ධාගම ඇතුලුව විවිධ ආගම් පිලිබඳව අධ්‍යනයන් සිදුකල අතර, රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයේ ඉගැන්වීම් සහ එහි මෙහෙවර ගැන ඉගෙන ගත්තා. වර්තමානය වන විට, රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයේ විවිධ වැඩසටහන් වලට සහභාගී වෙමින් මීලග සභාපති ලෙස පුහුණු වෙමින් සිටිනවා.

මීට අමතරව දරුවන් 4 දෙනෙකුගේ මවක් ලෙසින් සතුටින් පිරි ආදර්ශමත් පවුල් ජීවිතයක් ගතකරමින් සිටිනවා.


සිනහමුසු මුහුණින්, සුහදශීලීව සහ හොද පෞරුෂයකින් යුතුව හැමෝත් සමගම කටයුතු කරන බැවින්, සාමාජිකයින්ගේ ආදරයට ගෞරවයට පාත්‍රවේ.

**ඔබේ දැනුමට**

කෝෂෝ මහත්මිය 1995 අවුරුද්දේදී, මුනෙහිරෝ මහතා සමග විවාහ වූ අතර විවාහ උත්සවය මූලස්ථාන ධර්ම මන්දිරයේදී රට පුරා ධර්ම ශාඛාවන්හි සාමාජිකයින් 9000ක් පමණ පිරිස සමග පවැත්විය.



# Rissho Kosei-kai: A Global Buddhist Movement




**Rissho Kosei-kai Buddhist Church of Hawaii**
2280 Auhuhu Street, Pearl City, HI 96782, USA
TEL: 1-808-455-3212 FAX: 1-808-455-4633
Email: sangha@rkhawaii.org URL: http://www.rkhawaii.org

**Rissho Kosei-kai Maui Dharma Center**
1809 Nani Street, Wailuku, HI 96793, USA
TEL: 1-808-242-6175 FAX: 1-808-244-4625

**Rissho Kosei-kai Kona Dharma Center**
73-4592 Mamalahoa Highway, Kailua-Kona, HI 96740, USA
TEL: 1-808-325-0015 FAX: 1-808-333-5537

**Rissho Kosei-kai Buddhist Center of Los Angeles**
2707 East First Street, Los Angeles, CA 90033, USA
TEL: 1-323-269-4741 FAX: 1-323-269-4567
Email: rk-la@sbcglobal.net URL: http://www.rkina.org/losangeles.html

Please contact Rissho Kosei-kai Buddhist Center of Los Angeles
**Rissho Kosei-kai Buddhist Center of Arizona**
**Rissho Kosei-kai Buddhist Center of Colorado**
**Rissho Kosei-kai Buddhist Center of San Diego**
**Rissho Kosei-kai Buddhist Center of Las Vegas**
**Rissho Kosei-kai Buddhist Center of Dallas**

**Rissho Kosei-kai of San Francisco**
(Address) 1031 Valencia Way, Pacifica, CA 94044, USA
(Mail) POBox 778, Pacifica, CA 94044, USA
TEL: 1-650-359-6951 Email: lotusbuddhist@gmail.com
URL: https://sf-buddhism.org/

Please contact Rissho Kosei-kai of San Francisco
**Rissho Kosei-kai of Sacramento**
**Rissho Kosei-kai of San Jose**

**Rissho Kosei-kai of New York**
320 East 39th Street, New York, NY 10016, USA
TEL: 1-212-867-5677 Email: rkny39@gmail.com URL: http://rk-ny.org

**Rissho Kosei-kai of Chicago**
1 West Euclid Ave., Mt. Prospect, IL 60056, USA
TEL: 1-773-842-5654
Email: murakami4838@aol.com URL: http://rkchi.org

**Rissho Kosei-kai of Fort Myers**
URL: http://www.rkftmyersbuddhism.org

**Rissho Kosei-kai Dharma Center of Oklahoma**
(Address) 2745 N.W. 40th St., Oklahoma City, OK 73112, USA
(Mail) POBox 57138, Oklahoma City, OK 73157, USA
TEL: 1-405-943-5030 FAX: 1-405-943-5303
Email: rkokdc@gmail.com URL: http://www.rkok-dharmacenter.org

**Rissho Kosei-kai Dharma Center of Dayton**
617 Kling Drive, Dayton, OH 45419, USA
URL: http://www.rkina-dayton.com

**The Buddhist Center Rissho Kosei-kai International of North America (RKINA)**
2707 East First St., Suite #1, Los Angeles, CA 90033, USA
TEL: 1-323-262-4430 FAX: 1-323-269-4567
Email: info@rkina.org
URL: https://www.buddhistcenter-rkina.org

**Rissho Kosei-kai of Vancouver**
Please contact RKINA

**Rissho Kosei-kai International**

**Rissho Kosei-kai Buddhist Center of San Antonio**
(Address) 6083 Babcock Road, San Antonio, TX 78240, USA
(Mail) POBox 692148, San Antonio, TX 78249, USA
TEL: 1-210-558-4430 FAX: 1-210-696-7745
Email: dharmasanantonio@gmail.com
URL: http://rksabuddhistcenter.org

**Rissho Kosei-kai of Seattle's Buddhist Learning Center**
28621 Pacific Highway South, Federal Way, WA 98003, USA
TEL: 1-253-945-0024 Email: rkseattlewashington@gmail.com
URL: http://buddhistlearningcenter.org

**Risho Kossei-kai do Brasil**
Rua Dr. José Estefno 40, Vila Mariana, São Paulo-SP, CEP 04116-060, Brasil
TEL: 55-11-5549-4446, 55-11-5573-8377
Email: risho@rkk.org.br URL: http://www.rkk.org.br

**在家佛教韓国立正佼成会　Korean Rissho Kosei-kai**
〒 04420 大韓民国 SEOUL 特別市龍山區漢南大路 8 路 6-3
6-3, 8 gil Hannamdaero Yongsan gu, Seoul, 04420, Republic of Korea
TEL: 82-2-796-5571　FAX: 82-2-796-1696

**在家佛教韓国立正佼成会釜山支部**
**Korean Rissho Kosei-kai of Busan**
〒 48460 大韓民国釜山廣域市南區水營路 174, 3F
3F, 174 Suyoung ro, Nam gu, Busan, 48460, Republic of Korea
TEL: 82-51-643-5571　FAX: 82-51-643-5572

**社團法人在家佛教立正佼成會　Rissho Kosei-kai of Taipei**
台湾台北市中正區衡陽路 10 號富群資訊大厦 4 樓
4F, No. 10, Hengyang Road, Jhongjheng District, Taipei City 100, Taiwan
TEL: 886-2-2381-1632, 886-2-2381-1633　FAX: 886-2-2331-3433

**台南市在家佛教立正佼成會　Rissho Kosei-kai of Tainan**
台湾台南市東区崇明 23 街 45 號
No. 45, Chongming 23rd Street, East District, Tainan City 701, Taiwan
TEL: 886-6-289-1478　FAX: 886-6-289-1488
Email: koseikaitainan@gmail.com

**Rissho Kosei-kai South Asia Division**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8141　FAX: 66-2-716-8218

**Rissho Kosei-kai of Kathmandu**
Ward No. 3, Jhamsikhel, Sanepa-1, Lalitpur, Kathmandu, Nepal

**Rissho Kosei-kai Society of Kolkata**
89 Srirampur Road (VIP), Garia, Kolkata 700084, India

**Rissho Kosei-kai of Kolkata North**
AE/D/12 Arjunpur East, Teghoria, Kolkata 700059,
West Bengal, India

**Rissho Kosei-kai of Bodhgaya Dharma Center**
Ambedkar Nagar, West Police Line Road, Rampur, Gaya-823001,
Bihar, India

**Rissho Kosei-kai of Patna Dharma Center**
Please contact Rissho Kosei-kai Society of Kolkata

**Rissho Kosei-kai of Central Delhi**
77 Basement D.D.A. Site No. 1, New Rajinder Nagar,
New Delhi 110060, India

**Rissho Kosei-kai of Singapore**
Please contact Rissho Kosei-kai International

**Rissho Kosei-kai of Phnom Penh**
W.C. 73, Toul Sampaov Village, Sangkat Toul Sangke, Khan Reouseykeo,
Phnom Penh, Cambodia

**RKISA Rissho Kosei-kai International of South Asia**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8141　FAX: 66-2-716-8218

**Rissho Kosei-kai of Bangkok**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8216　FAX: 66-2-716-8218　Email: info.thairissho@gmail.com

**Rissho Kosei Dhamma Foundation**
No. 628-A, Station Road, Hunupitiya, Wattala, Sri Lanka
TEL: 94-11-2982406　FAX: 94-11-2982405

**Rissho Kosei-kai of Polonnaruwa**
Please contact Rissho Kosei Dhamma Foundation

**Rissho Kosei-kai Bangladesh**
85/A Chanmari Road, Lalkhan Bazar, Chittagong, Bangladesh
TEL: 880-2-41360470

**Rissho Kosei-kai Mayani**
Mayani Barua Para, Mirsarai, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Damdama**
Damdama Barua Para, Mirsarai, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Satbaria**
Village: Satbaria Bepari Para, Chandanaih, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Chendhirpuni**
Village: Chendhirpuni, P.O.: Adhunogar, P.S.: Lohagara, Chittagong,
Bangladesh

**Rissho Kosei-kai Raozan**
Dakkhin Para, Ramzan Ali Hat, Raozan, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Laksham**
Village: Dhupchor, Laksham, Comilla, Bangladesh

**Rissho Kosei-kai Dhaka North**
408/8 DOSH, Road No 7 (West), Baridhara, Dhaka, Bangladesh

**Rissho Kosei-kai Cox's Bazar**
Ume Burmize Market, Tekpara, Sadar, Cox's Bazar, Bangladesh

Please contact Rissho Kosei-kai Bangladesh
**Rissho Kosei-kai Patiya**
**Rissho Kosei-kai Ramu**
**Rissho Kosei-kai Aburkhil**

**Buddiyskiy khram "Lotos"**
4 Gruzinski Alley, Yuzhno-Sakhalinsk 693005, Russia
TEL: 7-4242-77-05-14

**Rissho Kosei-kai of Hong Kong**
Flat D, 5/F, Kiu Hing Mansion, 14 King's Road, North Point, Hong Kong, China

**Rissho Kosei-kai Friends in Shanghai**
Please contact Rissho Kosei-kai International

**Rissho Kosei-kai of Ulaanbaatar**
(Address) 15F Express Tower, Peace avenue, khoroo-1, Chingeltei district,
Ulaanbaatar 15160, Mongolia
(Mail) POBox 1364, Ulaanbaatar-15160, Mongolia
TEL: 976-70006960　Email: rkkmongolia@yahoo.co.jp

**Rissho Kosei-kai of Erdenet**
Please contact Rissho Kosei-kai International

**Rissho Kosei-kai di Roma**
Via Torino, 29, 00184 Roma, Italia
TEL/FAX: 39-06-48913949　Email: roma@rk-euro.org

Please contact Rissho Kosei-kai di Rome
**Rissho Kosei-kai of Paris**
**Rissho Kosei-kai of Venezia**

**Rissho Kosei-kai of the UK**
29 Ashbourne Road, London W5 3ED, UK
TEL: 44-20-8933-3247　Email: info@rkuk.org　URL: https://www.rkuk.org
Facebook: https://www.facebook.com/rkuk.official
Twitter: https://twitter.com/rkuk_official
Instagram: https://www.instagram.com/rkuk_official

**Rissho Kosei-kai International Buddhist Congregation (IBC )**
166-8537 東京都杉並区和田 2-7-1 普門メディアセンター 3F
Fumon Media Center 3F, 2-7-1 Wada, Suginami-ku, Tokyo 166-8537, Japan
TEL: 03-5341-1230　FAX: 03-5341-1224　URL: http://www.ibc-rk.org

**Published by Rissho Kosei-kai International**